# ආයුර්වේද ඖෂධාගාරයන්ට බලපාන නියෝග -1973

01. මෙම නියෝග 1973 ආයුර්වේද ඖෂධාගාර නියෝග නමින් හැඳින්විය හැකි අතර, ඒවා 1977.01.01 වැනි දින වලංගු විය යුතුය.

02. (I) ආයුර්වේද ඖෂධාගාරයක් වශයෙන් පාවිච්චිය සඳහා කිසියම් ස්ථානයක ලියාපදිංචිය එසේ ලියාපදිංචි කරනු ලැබූ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින වලංගු විය යුතුය.

(II) කිසියම් ස්ථානයක් ආයුර්වේද ඖෂධාගාරයක් වශයෙන් සඳහා වු ලියාපදිංචි වු සෑම ඉල්ලුම් පත්‍රයක්ම ලියාපදිංචිය ඉල්ලා සිටින වර්ෂයට කලින් වර්ෂයේ අගෝස්තු මස 31 වැනිදා හෝ ඊට පෙර කොමසාරිස් වෙත යැවිය යුතු අතර , එම ඉල්ලුම් පත්‍රය මෙයට අමුණා ඇති උපලේඛනයේ දක්වෙන (අ) ආකෘතියට අනුව සකස් කොට තිබිය යුතුයි.

(III) එබඳු ලියාපදිංචියක් සඳහා ගෙවිය යුතු ගාස්තුව රු. 5000/ ක් විය යුතුය.

03. ලියාපදිංචි කිරිමට ඇති ස්ථාන සහ එහි භාවිතයට ගැනිමට යන උපකරණ පහතින් සඳහන් කොන්දේසි වලට අනුකුල වන්නේ නම් මිස නැත්තම් , මෙම නියෝග යටතේ කිසියම් ස්ථානයක් ආයුර්වේද ඖෂධාගාරයක් වශයෙන් ලියාපදිංචි නොකළ යුතුය.

(I) (අ) ස්ථානය මනාව අලුත් වැඩියා කර තිබිය යුතුය. හොඳින් වාතාශ්‍රය ලැබෙන සේ සකසා තිබිය යුතු අතර මැනවින් ආලෝකමත්ව තිබිය යුතුය. විවෘත කළ හැකි ජනේල සෑම කාමරයකම තිබිය යුතුය. ජනේල විවෘත කර තැබු විට, එහි වර්ග ප්‍රමාණය මතු පිට ගෙබිම ප්‍රමාණයේ $15/^{1}$ පංගුවක ප්‍රමාණයට අඩු නොවිය යුතුය.

(ආ) සෑම කාමරයකම බිත්ති සෑම තැනින්ම උසින් අඩි 07 කට අඩු නොවිය යුතු අතර, බිත්ති ගඩොලින්, ගලින් හෝ කබොකින් සාදා නිම කොට තිබිය යුතුය. බිත්ති වල ඇතුල් පැත්ත හුණු බදාම කොට හෝ පිරියම් කොට තිබිය යුතුය.

(ඇ) පියසි කෙළවර පොළවේ සිට අඩි 06ක් වත් උසින් විය යුතුය.

(ඈ) කල්පවතින භාණ්ඩයකින් වහලය සාදා තිබිය යුතුය.

(ඉ) ලීදඬු වල තෙල් වර්ග ආලේප කොට හෝ හුණු ගා තිබිය යුතුය.

(ඊ) ගෙබිම සෑම තැනම සිමෙන්ති දා තිබිය යුතුය.

(උ) ස්ථානයට සෑහෙන සේ කසළ කාණු සපයා තිබිය යුතුය.

(II) (අ) ඖෂධ නිෂ්පාදනයකරන එක් එක් කාමරයේ මතුපිට ගෙබිම ප්‍රමාණය පළල අඩි 12 ක් සහ දිග අඩි 20ට අඩු නොවිය යුතුය. ඇතුල් බිත්ති වල බිම සිට අඩි 4 ප්‍රමාණය පිඟන් ගඩොලින් සකස් කොට නැතහොත් සිමෙන්ති බදාම යොදා සකස් කොට තිබිය යුතුය.

(ආ) ඖෂධ සකස් කිරිම සඳහා උපයෝගී කරගන්නා ලිප, බිම සිට අඩු වශයෙන් අඩි එකක් වත් උසට තැනු පිලක් මත විය යුතු අතර, ලිපට පිටතින් දර හෝ තෙල් දැමීමට හැකිවන සේ එය සකස්ව තිබිය යුතුය.

(ඇ) ස්ථානයේ ඉතිරි කොටසට දුම පැතිර යාම වළක්වනු සඳහා ලිපට උඩින් දුම් කවුළුවක් සකස් කොට තිබිය යුතුය.

(ඈ) ගෙබිම සඳහා බිත්ති සෝදා පවිත්‍ර කිරීමට හැකිවන සේ ඖෂධ නිෂ්පාදනය හෝ සකස් කිරීම සඳහා භාවිතා කරන මේස, වංගෙඩි, මෝල් ගස්, පිහියා, සහ සියලුම බඳුන් තැනින් තැනට ගෙන යා හැකිවන සේ තිබිය යුතුය.

(ඉ) ඖෂධ මිශ්‍ර කිරීම, කැපීම නැතහොත් ශුද්ධ කිරීම සඳහා භාවිතා කරන එක් එක් මේසයේ මතුපිට මනාව සකස් කළ හොඳින් හේත්තුව තිබෙන ලෑලි වලින් නැතහොත් වෙනත් කිසියම් හානිකර නොවන ද්‍රව්‍යයකින් සාදා නිමකොට තිබිය යුතුය.

(ඊ) ඖෂධ නිෂ්පාදනය සඳහා උපයෝගී කරගන්නා බෙහෙත් පැළෑටි හා වෙනත් බෙහෙත් බඩු ගබඩා කර හෝ ආවරණය කළ භාජනවල තැබිය යුතුය. අමු බෙහෙත් පැළෑටි පාවිච්චි කරන කවර අවස්ථාවක වුවද හොඳින් වාතාශ්‍රය ලැබෙන ස්ථානයක ගබඩා කර තැබිය යුතුය.

(උ) ඖෂධාගාරය, වැසිකිළි, කුණුවලවල්, පොහොර ගොඩවල් හෝ විවෘත කාණු වලින් යටත් පිරිසෙන් අඩි පනහක්වත් බැහැරින් පිහිටා තැබිය යුතුය.

04. (I) යම්කිසි ඖෂධාගාරයක ලියාපදිංචිය වලංගුව පවතින කාල සීමාව තුළ කිනම් අවස්ථාවකදී හෝ ඖෂධාගාරය සඳහා යොදා ගනු ලබන යම් ගොඩනැගිල්ලක් තුන් වැනි නියෝගයේ විධි විධානයන්ට අනුකූල නොවන තත්වයකට පත්වුවහොත් එම ගොඩනැගිලි එකී විධිවිධානයන්ට අනුකූල වීමට අවශ්‍ය කටයුතු නිවේදනයේ නියමිත දිනයකට පෙරාතුව යෙදවීමට නිම කෙරෙමින් ඖෂධාගාරයේ අයිතිකරු වෙත නිවේදනයක් නිකුත් කරවීම කොමසාරිස් විසින් කළ හැකිය.

(II) මෙම නියෝගයේ (I) වැනි ඡේදය යටතේ ලිඛිත නිවේදනයක් නිකුත් කරනු ලැබූ සෑම ඖෂධාගාරයක අයිතිකරුවෙක්ම එකී නිවේදනයේ නියමිත කාලය තුළදී නිවේදනයේ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

(III) I වන ඡේදය යම් නිවේදනයක් ඖෂධාගාරයේ අලවන ලදහොත් ඖෂධාගාරයේ සේවයේ යොදවනු ලැබූ කවර හෝ තැනැත්තෙකු වෙත තබා යනු ලැබුවහොත් එසේ නැත්තම් ඖෂධාගාරයේ ලියාපදිංචි කරන ලද ලිපිනයට ලේඛනගත තැපෑලෙන් යවනු ලදහොත්, එකී නිවේදනය අයිතිකරු වෙත නිකුත් කළා සේ සැළකිය හැකිය.

05. සෑම ආයුර්වේද ඖෂධාගාරයකම අයිතිකරුවෙක්ම සිය නාමයද " ලියාපදිංචි කළ ආයුර්වේද ඖෂධාගාරය " යන වචනයද පුවරුවක කියවිය හැකි සේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සටහන් කොට ඖෂධාගාරයේ පිට පැත්තේ හොඳින් පෙනෙන තැනක එල්ලා තැබිය යුතුය.

06. කොමසාරිස්ට හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් තැනැත්තෙකුට සියලු සෑහෙන වකවානු වලදී පරීක්ෂා කර බැලීම සඳහා සෑම ඖෂධාගාරයක අයිතකරුවකු විසින්ම සියලුම ඖෂධාගාරයන්ට මෙම නියෝග වල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා වලින් සකස් වූ පිටපතක් සහ ලියාපදිංචි සහතිකය රාමු කොට මැනවින් පෙනෙන තැනක එල්ලා තැබීමටද, සියලුම සේවකයන්ගේ නම්, ගම් වට්ටෝරුවක් ඖෂධාගාරයේ තබා තිබීමටද සැලැස්විය යුතුය.

07. සෑම ඖෂධාගාර අයිතිකරුවෙක්ම ඖෂධාගාරයට අයත් සෑම කාමරයක බිත්ති සහ පෝරු වියන වර්ෂයකට දෙවරක් හුණු ගා සුදු කර තැබිමට සැලැස්විය යුතුය. දූව දඬු ජුනි සහ දෙසැම්බර් යන මාසවලදී යටත් පිරිසයින් වර්ෂයකට දෙවරක්ද කොමසාරිස් තැන නියෝග කළහොත් වෙනත් ඕනෑම අවස්ථාවකදී ද හුණු ගා සුදු කිරිමට හෝ දූව දඬුවල තෙල්වර්ග ආලේප කර තිබේ නම් සබන් ගා උණු වතුරින් සේදිමටද ඔහු කටයුතු යෙදවිය යුතුය.

08. සෑම ඖෂධාගාර අයිතිකරුවෙක්ම ගෙබිම සහ බිත්ති වල පිඟන් ගඩොල් යෙදූ, හෝ සිමෙන්ති දූමු කොටස්ද, මේසවල උඩ කොටස් සහ සෙසු බඳුන් දිනපතා සේදවිය යුතුය. ඖෂධාගාරයේ සෑම ස්ථානයක්ම හා එය අවට පෙදෙස සහ කසළ කාණු පවිත්‍රවත්ව හා මනා තත්වයෙන්, ලියාපදිංචි කරන ලද ස්ථානයේ කසළ කුණු, කාණු, වලවල් ආදියෙන් දුගඳ වහනය වන හෝ පීඩාකර දේ ඉවත් කර තැබිමටත්, ඔහු කටයුතු යෙදිය යුතුය. ඖෂධ නිෂ්පාදන සඳහා උපයෝගි කර ගන්නා සියලු ලී බඩු බඳුන් සහ උපකරණ පිරිසිදුවවත්, සනිපාරක්ෂක තත්වයටත් තබා තිබීමට ඔහු කටයුතු යෙදවිය යුතුය. සියලු කසළ වහාම ආවරණය කළ භාජනයට දමා තැබීමටත්, එම භාජනය දිනකට වරක් ඖෂධාගාරයෙන් ඉවතට ගෙන ගොස් හිස් කිරිමටත්, ඔහු කටයුතු යෙදවිය යුතුය. කසළ බහාලන අවස්ථාවේදී හැර සියලු කල්හි භාජනය වසා තැබිය යුතුය.

09. කිසිම තැනැත්තකු විසින් යම් සතෙකු හෝ පක්ෂියෙකු ඖෂධාගාරයට අයත් භූමිය තුළ තබා නොගත යුතුය.

10. (I) යම් කිසි බෝවන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ චර්මීය රෝගයකින් පෙළෙන නැතහොත් මෑතදී පෙලුන නැතහොත් එබඳු රෝගයකින් පෙළෙන අයෙකුට මෑතදී සත්කාරයෙහි නියැලුණු කිසිම තැනැත්තෙකු එම රෝග බෝවීමේ සහ බීජ මේරීමේ කාල සීමාව ඉකුත් වන තුරු ඖෂධාගාරයට ඇතුල් වීම හෝ ඖෂධ නිෂ්පාදනයේ යෙදිම නොකළ යුතුය.

11. ඖෂධාගාරයක අයිතිකරුවෙක් තමා දැනුවත් වීම මේ නියෝගයේ (I) වන ජේදයේ විධි විධාන උල්ලංඝනය කිරිමට කිසිම තැනැත්තෙකුට ඉඩ නොදිය යුතුය.

12. ඖෂධාගාරයක අයිතිකරුවෙකු විසින් ඖෂධ ගබඩා කොට හෝ ඖෂධ නිෂ්පාදනය සඳහා උපයෝගි කර ගන්නා ද්‍රව්‍ය ගබඩා කොට තබා තිබෙන කිසියම් කාමරයක ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා දේ හැර වෙනත් කිසිම ලී බඩුවක්, රෙදිපිළි, පැදුරු නැතහොත් වෙනත් කිසිම භාණ්ඩයක් ගබඩා කර ගැනීම නොකළ යුතුවාක් මෙන් ගබඩා කිරිම හෝ තැබීමට හෝ ඉඩදීම නොකළ යුතුය.

13. ඖෂධාගාරයක අයිතිකරුවෙකු විසින් ඖෂධාගාරයක එම බෙහෙත් නිෂ්පාදනය කෙරෙන නැතහොත් බෙහෙත් ගබඩා කර තිබෙන ස්ථානය නිදන ස්ථානයෙන් හොඳින් වෙන් කර ඇත්නම් හෝ බෙහෙත් ද්‍රව්‍ය ගෙබිම සිට පෝරු වියන දක්වා විහිදෙන බිත්තියකින් නිදන ස්ථානය වෙන් කොට ඇත්නම් මිස හා එම නිදන ස්ථානයට මතුපිට ගෙබිම ප්‍රමාණයෙන් පහළොවෙන් එක

පංගුවක  ප්‍රමාණයක වර්ග ප්‍රමාණයක් ඇති බාහිර ජනේල සපයා නැත්නම්, ඖෂධාගාරයේ කිසිම ස්ථානයක් නිදන ස්ථානයක් හැටියට පාවිච්චි නොකළ යුතුවාක් මෙන්ම, පාවිච්චි කිරීමට ඉඩදීම ද නොකළ යුතුය.

14. ඖෂධ නිෂ්පාදනයේ නියැලී සෑම කෙනෙක්ම ඖෂධ නිෂ්පාදනයේ යෙදීමට පෙර තම අත් සෝදා පවිත්‍ර කර ගත යුතු අතර , හිස්වැසුම්ද , සිය සිරුර සහ ළය ආවරණය කෙරෙන සුදු පිරිවැස්මක්ද ඇඳ සිටිය යුතුය.

15. සෑම ඖෂධාගාරයක අයිතිකරුවෙක්ම ලියාපදිංචි කළ ස්ථානයට ගෙන ගිය හැකි සෑහෙන ජලය ප්‍රමාණයක් සපයා තිබිය යුතුය.

16 සෑම ඖෂධාගාරයක අයිතිකරුවෙක්ම මහජනයා නැතහොත් , සිල්ලර වෙළෙන්දාට විකුනණ සෑම බෙහෙත් බෝතලයක් සහ නිෂ්පාදිත බෙහෙත් පාර්සලයක් වාතය ඇතුළට නොයන ලෙස හොඳින් අසුරා තිබෙන බවටත්, ඖෂධාගාරයේ නම, ලියාපදිංචි අංකය සහ වෙනත් අදාළ උපදෙස් හා තොරතුරු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා වලින් දක්වෙන ලේබලයක් බෝතලයේ හෝ පාර්සලයේ අලවා ඇති බවටත් වග බලා ගත යුතුය.

17. සෑම ආයුර්වේද ඖෂධාගාර අයිතිකරුවෙක් විසින්ම ඖෂධාගාරයේ පාවිච්චි කරනු ලබන සියලුම බෝතල් සහ බඳුන් ඒවා සේදීම සුදානම් කර තබා තිබෙන ටැංකියක මුලින්ම සේදවිය යුතුය. එයින් පසු ඒවා සේදීම සඳහා සුදානම් කර තබා තිබෙන වෙනත් ටැංකියක හෝ නළ මඟින් සැපයෙන ජලය තිබෙන ස්ථානයක නම් ගලා යන වතුරෙන් සෝදා පිරිසිදු කළ යුතුය.

18. සෑම ආයුර්වේද ඖෂධාගාර අයිතිකරුවෙක්ම නිෂ්පාදනය සඳහා අපවිත්‍ර වීමේ ඉඩකඩ මැනවින් ඇහිරූ ජල ස්ථානයකින් ජලය ලබාගත යුතුය. එසේ ලබාගත් ජලය ඖෂධාගාරයට ගෙන එන අතර මගදී අපවිත්‍ර නොවන බවට වග බලාගත හැකි ක්‍රමයකින් ගෙන ආයුතුය. ඒ වතුර ඖෂධාගාරයෙහි නිසි පරිදි කරන ලද ටැංකිවල ජලාශවල හෝ භාජනවල ගබඩා කර තිබිය යුතුය.

19. ඖෂධ නිෂ්පාදනය සඳහා සහ ඒ හා සම්බන්ධ වෙනත් කවර හෝ කටයුත්තකට සහ බෝතල් හා බඳුන් සේදිම සඳහා යොදා ගන්නා ජලය සුදුසු පරිදි පෙරා ගත යුතු අතර , එම ජලය රසායනික සහ ශාබාණු විද්‍යාත්මක පර්යේෂණයකට භාජනය කළවිට එම ජලය ශුද්ධ බව සහ සැපදායක බව ඔප්පු විය යුතුය. අනුමත ප්‍රසිද්ධ ජල මාර්ගයකින් එසේ වුවද ලබාගන්නා ජලය මෙම නියෝගයේ මුලින් සඳහන් විධි විධානයන්ට අනුකූල නොවී පාවිච්චි කිරීමට කොමසාරිස් විසින් අවසර දිය හැකිය.

20. ඖෂධාගාරයක සියලුම ඖෂධ දැඩි ස්වස්ථතා තත්වයක් යටතේ සකස් කළ යුතුය.

21. (I) මහජනයාට විකිණීමට තිබෙන යම් ඖෂධයක් සකස් කිරීමේ සෑම සූත්‍රයක්ම ඒ කාර්යය සඳහා පත් කරන ලද සූත්‍ර කමිටුව මඟින් අනුමත කළ යුතුයි.

(II) අනුමත කරන ලද සූත්‍රයන්හි යම් වෙනසක් හෝ එකතු කිරීමක් හෝ නැතහොත් කපා හැරීමක් සඳහා සූත්‍ර කමිටුවේ අනුමැතිය අවශ්‍ය විය යුතුය.

22. සෑම ඖෂධාගාරයක්ම ආයුර්වේද ඖෂධවේදියෙකු හෝ ලියාපදිංචි ආයුර්වේද සර්වාංග වෛද්‍යවරයෙකු සේවයේ යොදවා ගත යුතුය. ඔහුගේ ලියාපදිංචි සහතිකයද නිෂ්පාදනාගාරයේ පෙනෙන පරිදි තැබිය යුතුය.

23. සෑම ඖෂධාගාරයක අයිතිකරුවෙක්ම පහත සඳහන් ලේඛන තබා ගත යුතු අතර, කොමසාරිස් තැන විසින් බලය පවරනු ලැබූ කිසියම් තැනැත්තෙකුට එම ලේඛන පරීක්ෂා කිරීමට ඉඩදිය යුතුය.

I. ඖෂධ සංයෝග සඳහා උපයෝගි කර ගන්නා සූත්‍ර දක්වෙන ලේඛනය, එහි ඖෂධ සඳහා ගන්නා වත්මන් වර්ගයේ බෙහෙත් ද්‍රව්‍ය ප්‍රමාණයක් දක්විය යුතුයි.

II. එක් එක් සංයෝගය සඳහා වූ සූත්‍ර දක්වෙන රස ඖෂධ සංයෝග ලේඛනය

III. නිෂ්පාදිත ඖෂධ ලේඛනය

IV. ඖෂධ නිෂ්පාදනය සඳහා උපයෝගි කර ගන්නා අන්තරාදායක සහ විෂ සහිත බෙහෙත් ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු සහ එම ද්‍රව්‍ය ඉවත් කරන ආකාරය පිළිබඳ විස්තර අඩංගු ලේඛනය

V. නිෂ්පාදිත ඖෂධ විකුණනු ලබන අයගේ ලිපිනයන් සහ විකුණනු ලබන බෙහෙත් ප්‍රමාණයන් දක්වෙන ලේඛනයක්

24. ඖෂධාගාරයේ අයිතිකරුගේ නම, ඖෂධාගාරය පිහිටි ස්ථානය සහ එම ඖෂධාගාරයේ සකස් කරනු ලබන ඖෂධවල නම් ඇතුළත් කර කොමසාරිස් විසින් ලියාපදිංචි කළ සියලුම ඖෂධාගාරයන්ගේ ලේඛනයක් තබා ගත යුතුය.

25. (I) කොමසාරිස් විසින් නැතහොත් කොමසාරිස් විසින් ලියවිල්ලක් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පැවරුනු යම් නිලධාරියෙකු විසින් සියලු සාධාරණ අවස්ථාවන්හිදි ලියාපදිංචි කළ කිසියම් ඖෂධාගාරයකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(II) කොමසාරිස් විසින් නැතහොත් ඔහු විසින් ලියවිල්ලකින් බලය පැවරුණු යම් නිලධාරියකු විසින් ඖෂධාගාරයට ඇතුළු වී එය පරීක්ෂා කරනු ලැබීම සඳහා අයිතිකරු හෝ ඖෂධාගාරය භාරව සිටින තැනැත්තා ඉඩදිය යුතුය. තවද කොමසාරිස් විසින් හෝ ඔහු විසින් බලය පැවරුණු වෙනත් යම් නිලධාරියෙකුට ඒ සඳහා අවශ්‍ය වන සහාය සලසා දිය යුතුය.

26. යම් ඖෂධාගාරයක අයිතිකරුවෙක් කොමසාරිස් විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පැවරුණු වෙනත් යම් කිසි තැනැත්තෙකු විසින් පරීක්ෂා කර බැලීම සඳහා ඖෂධාගාරයේ නිෂ්පාදිත කිනම් ඖෂධයක බෙහෙතක්, කොමසාරිස් විසින් නියම කෙරෙන දිනයකට සහ වේලාවකට සහ ස්ථානයකට ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් කළ කවර වේලාවක හෝ එසේ ඉදිරිපත් කළ යුතුය. කොමසාරිස් සුදුසු යැයි සහ නිසි යැයි කියන ආකාරයක පරීක්ෂණයකින් සහ සෝදිසියකින් පසු පෙරාතුව වූ නියෝගයේ සඳහන් යම්කිසි ඖෂධයක් එය පාවිච්චි කරන යම්

තැනැත්තෙකුගේ පරිහරණය සඳහා නුසුදුසු බව හෝ සෞඛ්‍යයට හානිකර වීමට ඉඩ ඇති බව හෝ පෙනී ගියහොත්, කොමසාරිස් එම ඖෂධය හෝ බෙහෙත මහජනයාට හෝ කිසියම් වෙළෙන්දකුට විකිණීම වහාම නතර කළ යුතු බවට අයිතිකරු වෙත නිවේදනය කරමින් කොමසාරිස් විසින් ආඥාවක් කළ හැකි අතර, අයිතිකරු ඒ විගසම එම නියමයට අනුකූලව කටයුතු කළ යුතුය.

27. මෙම නියෝග වලින් කිසිවක් උල්ලංඝණය කිරීමේ වරදට දෙවරකට වැඩි වාර ගණනක් හෝ නිතර නිතර වරදකරු වූ ලියාපදිංචි කළ අයිතිකරුට හිමි ඖෂධාගාරයේ ලියාපදිංචිය නීත්‍යානුකූලව පැනවිය හැකි වෙනත් කිනම් හෝ දඬුවමකට අතිරේකව නිසි අධිකරණ බලය ඇති උසාවියක් විසින් අවලංගු කිරිම නීත්‍යානුකූල විය යුතු අතර එබඳු අවලංගු කිරීමක් වෙනුවෙන් කිසිත් අලාභයක් ලැබීමට අයිතිකරුට හිමිකම් නොවිය යුතුය.

28. පෙරාතුව වූ නියෝග වල කුමක් සඳහන් වුවද, ඉහත කී නියෝග කිසිවක් යම් ඖෂධාගාරයක් ලියාපදිංචි කරනු ලැබූ අයිතිකරු විසින් දිගටම උල්ලංඝණය කරගෙන යන බවට කොමසාරිස් සෑහීමකට පත් වුවහොත් ලියාපදිංචි කරනු ලැබූ අයිතිකරුට අයත් ඖෂධාගාරයේ ලියාපදිංචිය, කොමසාරිස් විසින් නියම කළහැකි **පරික්ෂණයකින් සහ විමර්ශනයකින්** පසු අවලංගු කිරිමට නැතහොත් **තාවකාලිකව නවතා** දැමීමට කොමසාරිස්ට බලය තිබිය යුතුය.

29. බලපත්‍රයක් අවලංගු කිරිමට කොමසාරිස් විසින් නිකුත් කළ ආඥාවකින් පීඩා විඳි යම් අයිතිකරුවෙකුට එම ආඥාව ලැබූ දින සිට දින 14 ක කාලසීමාව තුළදී, එම ආඥාවට විරුද්ධව ඇමතිවරයා වෙත අභියාචනාවක් ඉදිරිපත් කළ හැකිය.

30. මේ නියෝගවල ඃ-

"**පනත**" යන්නෙන් පසුව සංශෝධනය කරන ලද පරිදි වූ 1961 අංක 31 දරණ ආයුර්වේද පනත අදහස් වේ.

"**ආයුර්වේද ඖෂධාගාරය**" යන්නට පනතෙහි ඒ සඳහා දී ඇති අර්ථයම යෙදේ.

"**කොමසාරිස්**" යන්නෙන් පනත යටතේ පත් කරනු ලැබූ **ආයුර්වේද කොමසාරිස්වරයා** අදහස් වේ.